# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2030/39 - 2017 අගෝස්තු මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* :- 3/ඉ/අත්පත්/2.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :- 4-3/9/2013/WS/490.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 983, කිරිවානාපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිරිවානාපොල ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, 2016.11.16 දිනැති, අවසාන ගම් පිඹුරු අංක 443 අතිරේක අංක 5 පත්‍ර අංක 7 දරන මූලික පිඹුරේ කැබලි අංක 145 වශයෙන් දැක්වෙන "වැලිකන්දමූකලාන" නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0177 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

1. **කැබලි අංක 145**
ඉඩමේ නම: වැලිකන්දමූකලාන; ප්‍රමාණය: හෙක්. 0.0177.

*මායිම්* :

*උතුරට*: 146 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: 146 වැනි බිම් කැබැල්ල; *දකුණට*: 78 වැනි බිම් කැබැල්ල; *බටහිරට*: 39 වැනි බිම් කැබැල්ල.

හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය : 1. ටී. ඩබ්. සෙනෙවිරත්න මහතා, අංක 160/1, වැත්තෑව පාර, කිරිවානාපොල, මහරච්චිමුල්ල. 2. ටී. ඩබ්. චන්ද්‍රාවතී මහත්මිය, අංක 160/1, වැත්තෑව පාර, කිරිවානාපොල, මහරච්චිමුල්ල. 3. ටී. ඩබ්ලිව්. සීලවතී මැණිකේ මහත්මිය, අංක 160/1, වැත්තෑව පාර, කිරිවානාපොල, මහරච්චිමුල්ල. 4. ටී. ඩබ්ලිව්. සනත් දයානන්ද මහතා, අංක 160/1, වැත්තෑව පාර, කිරිවානාපොල, මහරච්චිමුල්ල. 5. ටී. ඩබ්ලිව්. කුසුමාවතී මහත්මිය, අංක 160/1, වැත්තෑව පාර, කිරිවානාපොල, මහරච්චිමුල්ල. 6. ටී. ඩබ්ලිව්. මාලනී හේමලතා මහත්මිය, අංක 160/1, වැත්තෑව පාර, කිරිවානාපොල, මහරච්චිමුල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 10.00 ට අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 සැප්තැම්බර් මස 12 වැනි දිනට මත්තෙන්, ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පී. සුසන්ත ජයතිලක,
ප්‍රාදේශීය ලේකම්,
අලව්ව.

2017 අගෝස්තු මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
08 - 662

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 26011 - 22 (2017/08)
)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.